# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1458/2 – 2006 අගෝස්තු 14 වැනි සඳුදා – 2006.08.14**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය

අංක 1419/3 සහ 2005.11.14 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය පිළිබඳ ගැසට් නිවේදනයේ පහත සඳහන් සංශෝධනයන් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇත.–

| *වගන්ති අංකය* | *වගන්තිය* | *සංශෝධනය* |
|---|---|---|
| 1 | ක්‍රියාත්මක වන දිනය | මෙහි " 3 වන වගන්තියේ සඳහන් වැටුප් පරිමාණයන් 2005.01.01 දින ක්‍රියාත්මක කිරීමට යටත්ව " යන කොටස ඉවත් කර එම වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.<br>1988 ජුනි මස 07 අංක 509/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1988 මැයි 27 දින දරන ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ එම සංග්‍රහයට වරින් වර කරනු ලැබූ සංශෝධනයන් ප්‍රකාර විධිවිධානයන් අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි මෙම ව්‍යවස්ථා සංග්‍රහය 2005 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය. |
| 2 | නිර්වචනය .– | "සේවය " යන්නට පහළින් පහත සඳහන් නිර්වචනයන් අළුතින් එකතු කරනු ලැබේ.<br>"සක්‍රීය සේවා කාලය " යනුවෙන් අදහස් වනුයේ යම් සේවාවක/තනතුරක භෞතිකව රාජකාරී භාර ගැනීමෙන් අනතුරුව ආරම්භ වන සේවා කාලයයි. (පත්වීමක් පෙරදාතම් කළ කාලයක් වේ නම්, හෝ පූර්ව දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි දෙන ලද පත්වීමක් නම් එම කාලය සක්‍රීය සේවය ලෙස ගණන් ගනු නොලැබේ.)<br>" සතුටුදායක සේවය " යනුවෙන් අදහස් වනුයේ නියමිත කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපයා ගෙන ඇති සහ එම කාලය තුළ කරන ලද වරදක් සම්බන්ධයෙන් අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමකට යටත්ව නැති සේවයකි. |

| | | |
|---|---|---|
| 11 | භාෂා ප්‍රවීණතාව | II වගන්තිය පහත පරිදි සංශෝධනය කර පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ.<br>II රාජ්‍ය භාෂා සහ සන්ධාන භාෂා ප්‍රවීණතාව.<br>(i) සේවයට පත් කරනු ලැබූ නිලධාරියෙකු පත්වීම් දින සිට වසර හයක් ඇතුළත ඔහු/ඇය සන්ධාන භාෂාව පිළිබඳ විභාගයෙන් සමත් විය යුතුය . සිංහල හෝ දෙමළ භාෂා මාධ්‍යයෙන් ඇතුළත් වූ නිලධාරීන් සඳහා සන්ධාන භාෂාව ඉංග්‍රීසි වේ.<br>(ii) ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ද අනිත් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාවය වසර 6 ක් ඇතුළත ද ලබාගත යුතුය.<br>(iii) එක් රාජ්‍ය භාෂාවකින් සේවයට ඇතුළත් වූ නිලධාරීන් අනිත් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබාගත යුතුය.<br><br>සටහන .–(i) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ අදාළ වෛකල්පිත භාෂාවකින් සමත් වී ඇති හෝ රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් ඊට සමානයයි පිළිගනු ලබන සහතිකයක් ලබා ඇති නිලධාරීන් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.<br>(ii) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව විෂයය සමත් වී ඇති නිලධාරීන් සන්ධාන භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ. |
| 12 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 12 වගන්තියට පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කරනු ලැබේ.<br>12 (iii) නියමිත කාලය තුළ පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම්වලින් සමත් වූ සන්ධාන භාෂාව සහ II වැනි වගන්තියේ සඳහන් භාෂා අවශ්‍යතා සපුරාලන ලද නිලධාරීන්ට වැටුප් වර්ධක 04 ලබාදී, අදාළ වැටුප් තලයෙහි පිහිටුවනු ලැබේ. |
| 17 | අන්තර්කාලීන විධිවිධාන | 17 වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.<br>ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ දී 2010.12.31 දක්වා වන කාලය අන්තර්කාලය ලෙස සලකනු ලැබේ. එම කාලය තුළ පහත සඳහන් පරිදි උසස්වීම් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| 17 (අ)(1) | | 17 වගන්තියේ 17(අ) 17(අ)(1) සහ 17(අ)(2) පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ. |
| 17 (අ) (2) | | 17 (අ) (1) සහ (2) පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.<br>(1) 14 සහ 15 යන ඡේදයන්හි සඳහන් වන උසස්වීම් ක්‍රම 2011.01.01 දින සිට පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කළ යුතුය.<br>(2) එදින දක්වා උසස්වීම් පහත සඳහන් පරිදි සිදුකළ යුතුය.<br>17 (අ1) (iv) සහ (v) වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය 17 (iv) ලෙස ආදේශ කරනු ලැබේ.<br>17 (iv) සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න වසර 5 ක කාල සීමාව තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 17 (ආ) | 1 පන්තියට උසස් කිරීම | 17(ආ) වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.<br>2010.12.31 දින දක්වා කරන උසස්වීම් සඳහා නියමිත දිනට පූර්වාසන්න වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරීන් සුදුසුකම් ලබයි. |
| 19 | | 19 ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ. |

*අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් සඳහා අදාළ වන කොන්දේසි.–*

ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 18 ඡේදය ප්‍රකාර අන්තර්ග්‍රහණය කරනු ලබන 2010.12.31 දින හෝ ඊට පෙර අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට හෝ වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹීම මත විශ්‍රාම ගන්නා නිලධාරීන් හැර අනිකුත් නිලධාරීන් සඳහා පහත දැක්වෙන කොන්දේසි බලපැවැත්වෙනු ඇත.

(i) ව්‍යවස්ථාවේ 18 (ii) වගන්තිය යටතේ සේවයේ " I " පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන සහ 17 (ආ) වගන්තිය යටතේ උසස්වීම් ලබන නිලධාරීන් 2011.01.01 දිනට පෙර පහත දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

(අ) මෙම ව්‍යවස්ථාවේ 14 (1) (ඇ) ඡේදය යටතේ නියම කර ඇති සුදුසුකම් සපුරාලිය යුතුය.

හෝ

(ආ). ලේකම්ගේ උපදෙස් අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂවරයා සමඟ කලින් එකඟ වූ පරිදි, රාජ්‍ය පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ආර්ථික විද්‍යාව සහ සමාජ සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව ලිඛිත නිබන්ධනයක් ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් පත්කරනු ලබන තීරක මණ්ඩලයක් ඉදිරියේ අදාළ නිලධාරියා එකී නිබන්ධනය ඉදිරිපත් කළ යුතුය.

(2) ව්‍යවස්ථාවේ 18 (iii) වගන්තිය යටතේ සේවයේ II පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන සහ 17(අ1) වගන්තිය යටතේ අන්තර් කාලය තුළ උසස් කරනු ලබන නිලධාරීන් 2011.01.01 දිනට පෙර පහත දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

(අ) රාජ්‍ය පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ආර්ථික විද්‍යාව සහ සමාජ සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සම්පූර්ණ කිරීම.

හෝ

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඒ සමාන පිළිගනු ලබන සුදුසුකමක් සපුරාලීම.

(3) ව්‍යවස්ථාව 18 (IV) වගන්තිය යටතේ සේවයේ III පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් 2011.01.01 දිනට පෙර පහත දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

පොදු කළමනාකරණ පාඨමාලාව ඇතුළු ව්‍යවස්ථාවේ 9(2)(අ)(1) යටතේ පුහුණු පාඨමාලා 04ක් සාර්ථකව අවසන් කිරීම.

පොදු කළමනාකරණ පාඨමාලාව ඉදිරියේ දී අවශ්‍යතාවක් නොවේ. අන්තර්කාලය තුළ දී 17(අ1) වගන්තිය යටතේ උසස්වීම් අපේක්ෂා කරන නිලධාරීන් පමණක් පොදු කළමනාකරණ පාඨමාලාව සාර්ථකව අවසන් කළ යුතුය.

එච්. ඩී. එල්. ගුණවර්ධන,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

09 – 38

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.